# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/270/2025 (PSC)

ඩී.ඒ.එන්.ප්‍රියංජලී
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.07.02.**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ජනනි දිසානායක මහත්මිය.

## -නියෝගය-

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සහ ඔවුනොවුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු.

අභියාචක ඩී.ඒ.එන්.ප්‍රියංජලී යන අය විසින්, **2025.10.13** දිනැතිව, මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඇයව **2024.01.15** දින සිට ක්‍රියාත්මක වන පරිදි ආකාරක්ෂමතාවය මත කරන ලද විශ්‍රාම ගැන්වීමේ නියෝගය බලරහිත කර, එදින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවා, හිමිවිය යුතු වැටුප් වර්ධක ලබාදී, හිඟ වැටුප් ද ගෙවන ලෙසට ය. ඊට අමතරව, **2025.07.15** දිනට ඇය වසර **20**ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හේතුවෙන් ඇයට I පන්තියේ උසස්වීම ලබාදී, විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන ලෙසටත් ඉල්ලා ඇත.

වසර **20**ක සේවා කාලය මත විශ්‍රාම ගැන්වීම සළකා බැලිය හැකි වන්නේ, කිසියම් පුද්ගලයෙකු සේවයේ සිටිමින්, සක්‍රිය සේවා කාලය වසර

20ක් සම්පූර්ණවීමෙන් අනතුරුවය. තවද, එම සහනය ලබාගත හැකි වන්නේ කාන්තා පොලිස් නිලධාරිනියන්ට සහ හෙද සේවයේ නියුතු නිලධාරිනියන්ට පමණි. ඒ අනුව එම ඉල්ලීම අනුව කටයුතු කිරීමට මෙම විනිශ්චය අධිකාරයට හැකියාවක් නැත.

ඉල්ලා ඇති අනිකුත් සහනයන් ලබාදිය හැකිද යන්න තීරණය කිරීම සඳහා ඉදිරිපත් ව ඇති සියළුම කරුණු සළකා බලන ලදි. අභියාචකගේ ප්‍රධාන ඉල්ලීම වන්නේ, 2025.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කර ඇති, ඇයව විශ්‍රාම ගැන්වීමට කර ඇති නියෝගය ඉවත් කර දෙන ලෙස කර ඇති ඉල්ලීමයි. එකී විනය නියෝගය, 2024.01.12 වෙනි දිනැති ලිපිය මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් අභියාචක වෙත නිකුත් කර ඇත. එම නියෝගය නිකුත් කිරීමට හේතුව වී ඇත්තේ, අභියාචක වෙත ඉදිරිපත් කරන ලද චෝදනා 04කට ඇයව වරදකරු බවට පත් කර තිබීමයි. අභියාචකට ඉදිරිපත් කර ඇති චෝදනා පහත දැක්වේ.

"I. **ඔබගේ ස්වාමිපුරුෂයා වන නීල් සුජීව ජයසිංහ යන අය කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරී ලෙස සේවය කරමින් සිටි 2006.02.01 සිට 2011.06.14 දක්වා වන කාල පරිච්ඡේදය තුළදී, විශ්‍රාමිකයෙක් නොවූ ජාතික හැඳුනුම්පත් අංක 755011967V දරණ කෑගල්ල මීපිටියේ පදිංචි කේ.පී.ඩී.රණසිංහ යන අයගේ මහජන බැංකුවේ අංක 027-2-002-9-1481726 දරණ ගිණුමට විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය හරහා 2010.10.07 දින හෝ ඊට ආසන්න දිනක වංචනික ලෙස බැර කර තිබුණු රුපියල් 715,975.41 ක මුදලින් රුපියල් අසූපන් දහසක (රු.85,000) මුදලක් 2010.11.01 දින හෝ ඊට ආසන්න දිනක කෑගල්ල සණස සංවර්ධන බැංකුවේ ඔබේ නමින් පවත්වාගෙන ගොස් ඇති අංක 277799 දරණ ගිණුමට බැර කිරීමට හෝ වෙනත් අයෙකු ලබා බැර කරවා ගැනීමට කටයුතු කිරීම තුළින් රජයේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලැසීම තුලින් බරපතල විෂමාචාරයක් සිදු කිරීම.**

II. **ඔබගේ ස්වාමිපුරුෂයා වන නීල් සුජීව ජයසිංහ යන අය කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරී ලෙස සේවය කරමින් සිටි 2006.02.01 සිට 2011.06.14 දක්වා**

වන කාල පරිච්ඡේදය තුලදී, විශ්‍රාමිකයෙක් නොවූ ජාතික හැඳුනුම්පත් අංක 755011967V දරණ කෑගල්ල මීපිටියේ පදිංචි කේ.පී.ඩී.රණසිංහ යන අයගේ මහජන බැංකුවේ අංක 027-2-002-9-1481726 දරණ ගිණුමට විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය හරහා 2010.10.07 දින හෝ ඊට ආසන්න දිනක වංචනික ලෙස බැර කර තිබුණු රුපියල් 715,975.41 ක මුදලින් රුපියල් එක්ලක්ෂ අනූ දහසක (රු.190,000) මුදලක් 2010.11.02 දින හෝ ඊට ආසන්න දිනක කෑගල්ල සණස සංවර්ධන බැංකුවේ ඔබේ නමින් පවත්වාගෙන ගොස් ඇති අංක 277799 දරණ ගිණුමට බැර කිරීමට හෝ වෙනත් අයෙකු ලබා බැර කරවා ගැනීමට කටයුතු කිරීම තුළින් රජයේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලැසීම තුලින් බරපතල විෂමාචාරයක් සිදු කිරීම.

III. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් රජයේ මුදලින් 2010.11.01 දින හෝ ඊට ආසන්න දිනකදී රුපියල් 85,000ක් හා/හෝ 2010.11.02 දින හෝ ඊට ආසන්න දිනකදී රුපියල් 190,000 ක් ලෙස මුළු මුදල වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑ පන්දහසක (රු.275,000.00) මුදලක් සණස සංවර්ධන බැංකුවේ කෑගල්ල ශාඛාවේ ඔබේ නමින් ඇති අංක 277799 දරණ පුද්ගලික ගිණුමට බැර කිරීමට හෝ වෙනත් අයෙකු ලබා බැර කරවා ගැනීමට කටයුතු කිරීම තුළින් රජයේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලැසීම තුලින් බරපතල විෂමාචාරයක් සිදු කිරීම.

IV. ඉහත චෝදනාවන්හි සඳහන් බරපතල විෂමාචාරයන් එකක් හෝ කීපයක් හෝ සියල්ලම සිදුකිරීම හෝ සිදු කිරීමට අනුබල දීම තුලින් ඔබ දරණ විශ්‍රාම වැටුප් නිලධාරී තනතුරත්, රජයේ සේවයත් අපකීර්තියට පත් කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලසීම.”

ඉහත කී චෝදනා සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එකී පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා හතරටම ඇය වැරදිකරු බවට පත් කර ඇත. එසේ නම් මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, ඉහත සඳහන් ආකාරයට අභියාචක වරදකරු කරමින් ලබා දී ඇති තීරණයෙහි නිරවද්‍යතාවයයි.

ප්‍රථම චෝදනා දෙකටම හේතුවූ ප්‍රධාන කරුණ වන්නේ, රු.85,000/= සහ රු.190,000/=ක ප්‍රමාණයන් ගෙන් යුක්තවූ මුදල් පිළිවෙලින් 2010.11.01 සහ 2010.11.02 යන දිනයන් හී දී ඇයගේ ගිණුමට තැන්පත් කර තිබීමයි. ඉහතකී මුදල් ප්‍රමාණය අභියාචගේ ගිණුමට තැන්පත් වී ඇති බව ලිඛිත සාක්ෂි මඟින් පැහැදිලිවම සනාථ වී ඇත. අභියාචක එම කරුණ හබකරන්නේ ද නැත.

එවැනි තත්ත්වයක් යටතේ එම මුදල අභියාචකගේ ගිණුමට බැරවී ඇත්තේ කුමන හේතුවක් නිසාද, කුමන ආකාරයකින් ද යන්න පැහැදිලි කිරීමේ වගකීම අභියාචක වෙත පැවරෙනවා ඇත. කිසියම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් යමෙකු තුළ ඇති විශේෂ දැනුම, ඔප්පු කිරීමේ භාරය එම විශේෂ දැනුම, ඒ ආකාරයෙන්ම ඔහු/ඇය වෙත පැවති බව, එම විශේෂ දැනුම ලත් පුද්ගලයා විසින්ම ඔප්පු කළ යුතු බව සාක්ෂි ආඥා පනතේ 106 වගන්තියෙහි සඳහන් කර ඇත. එය පහත දැක්වේ;

> "106. ***යම් කරුණක් යම් තැනැත්තෙකුගේ දැනීමට විශේෂයෙන් ඇතුළත් වන විට, එම කරුණ සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඔහු මත රැඳේ.***"

විශේෂයෙන්ම අභියාචක රජයේ සේවකයෙකු ලෙස ක්‍රියා කරමින් සිටියදී එම මුදල් ඇයගේ ගිණුමට බැරවී තිබෙන ආකාරය අභියාචක විසින් පැහැදිලි කර තිබිය යුතුය. මෙහිදී විශේෂයෙන් සළකා බැලිය යුතු වන්නේ, එකම ළඟ දින දෙකක් තුළ, එවැනි විශාල මුදලක් අභියාචකගේ ගිණුමට බැරවී තිබීමයි.

ඉහත සඳහන් කර ඇති පරිදි, නීතියේ සිද්ධාන්ත අනුව, කිසියම් පුද්ගලයෙකුගේ විශේෂ දැනුමට හසුවූ කරුණක් තිබේ නම්, එම කරුණ පැහැදිලි කිරීම, එම කරුණ පිළිබඳව වන විශේෂ දැනුම සතු තැනැත්තාගේ කාර්ය භාරය වනවා ඇත. මෙම රුපියල් දෙලක්ෂ හැත්තෑපන්දහසක (රු.275,000/=) මුදල අභියාචකගේ ගිණුමට බැර වී ඇති නිසා, එය ඇයගේ ගිණුම වෙත ලැබුණ ආකාරය, ඇය විසින් පැහැදිලි කළ යුතුය.

මේ සම්බන්ධයෙන් අභියාචක ප්‍රකාශ කර සිටින්නේ සහ අභියාචක විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඉහත කී

රුපියල් දෙලක්ෂ හැත්තෑපන් දහසක (රු.275,000/=) මුදලින්, රුපියල් එක් ලක්ෂ අනූදහසක (රු.190,000/=) මුදල, ඇයගේ ස්වාමි පුරුෂයාගේ ලොකු අම්මා විසින් ස්වාමි පුරුෂයාට භාරදීමෙන් අනතුරුව, එම මුදල් තැන්පත් කර ඇති බවයි. නමුත් එම තත්ත්වය සනාථ කිරීම සඳහා අභියාචකගේ ස්වාමිපුරුෂයා හෝ ඔහුගේ ඉහත කී ලොකු අම්මා යන අය විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂියට කැඳවා නැත. අභියාචක ප්‍රකාශ කර සිටින්නේ ඒ අවස්ථාව වන විට ලොකු අම්මා මියගොස් ඇති බවයි. අභියාචක තවදුරටත් පවසා සිටියේ ලොකු අම්මා විසින් ඉඩමක් විකිණීම හේතුවෙන්, එම මුදල් අභියාචකගේ ස්වාමි පුරුෂයා වෙත ලබා දී තිබූ බවයි. එසේ නම් විකුණුවා යැයි කියනු ලබන ඉඩම සම්බන්ධයෙන් වන ඔප්පුවක් හෝ එහි පිටපතක් හෝ ඉදිරිපත් කර තිබුණේ නම්, එම කරුණ සනාථ වන්නට තිබුණි. අභියාචක විසින් කියනු ලබන එම කරුණ හැරෙන්නට, මෙම රුපියල් එක් ලක්ෂ අනූදහසක (රු.190,000/=) මුදල අභියාචක වෙත ලැබුණ ආකාරය පැහැදිලි කිරීම සඳහා වෙනත් කිසිදු කරුණක් ඉදිරිපත් කිරීමට අභියාචක සමත් වී නැත.

තවද, ඉහතින් සඳහන්, පසුදින තැන්පත් කරන ලද රුපියල් අසූ පන්දහසක (රු.85,000/=) මුදල ද, ඇය වෙත ලැබුණ ආකාරය පැහැදිලි කිරීමට ද ඇය සමත් වන්නේ නැත. තවද, ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ ඉහත කී මුදල් විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය හරහා කේ.පී.ඩී.රණසිංහ යන අයගේ ගිණුමකට බැරවී තිබුණ බවයි. III වන චෝදනාවෙන් චෝදනා කර ඇත්තේ, ඉහත කී රුපියල් දෙලක්ෂ හැත්තෑ පන්දහසක (රු.275,000/=) මුදල අභියාචකගේ නමින් ඇති පුද්ගලික ගිණුමකට බැර කර ගැනීමට හෝ වෙනත් අයෙකු ලවා බැර කරවා ගැනීමට කටයුතු කර තිබීමයි.

ඉහත කී චෝදනාවන්හි සඳහන් සිද්ධිමය කරුණු, ඒ ආකාරයෙන් පැවති බව මෙම තීන්දුවෙහි ඉහතින් සඳහන් කර ඇති හේතුන් හී පැහැදිලිව දක්වා ඇත. එම සාක්ෂි සළකා බලා, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති III චෝදනාවට ද අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නැත.

IV චෝදනාව පදනම් කර ගෙන ඇත්තේ ප්‍රථම චෝදනා 03 මතය. එකී ප්‍රථම චෝදනා තුනට අභියාචක වරදකරු බවට පත් කිරීමේ දෝෂයක් නොමැති බවට දැනටමත් තීරණය කර ඇති හෙයින්, IV වන චෝදනාවටද අභියාචක වරදකරු කිරීමේ වරදක් නොපෙනේ.

ඉහත කී කරුණු සළකා බැලීමේ දී, අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය සම්බන්ධයෙන් මැදිහත් වීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහත කී කරුණු සළකා බලා ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-